සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
**Department of Divineguma Development**

1වන අධියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
1st 4 th floor, **Sethsiripaya ,Battaramulla**

මගේ අංකය / எனது இல / My No: DDD/HO/MF/05/02/2( වි.කො.

ඔබේ අංකය / உமது இல / Your No: ....................

දිනය / திகதி / Date: 2017.01

දිවිනැගුම බැංකු චක්‍රලේඛ අංක :- 2017/02

දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් වෙත,

**<u>දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති නිලධාරීන් සඳහා මාසිකව දීමනාවක් ගෙවීම - 2017 වර්ෂය</u>**

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිතිවල රාජකාරීවල නියුතු නිලධාරීන් එම බැංකු පද්ධතියෙහි මෙහෙයුම් ක්‍රියාවලිය දෛනිකව පවත්වා ගෙනයාම හා එම ඒකක ලාභදායිත්වය කරා මෙහෙයවමින් වඩා කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැලසීම වෙනුවෙන් ඇගයීමක් ලෙස මාසික දීමනාවක් ලබාදී දීමට අවශ්‍ය අනුමැතිය ලැබී ඇත.

ඒ අනුව එම දීමනාව ලබාගැනීම සඳහා හිමිකම් ලබන නිලධාරීන් හා ඔවුන්ට හිමි දීමනා පහත දක්වා ඇත.

**දිවිනැගුම ප්‍රජාමූල බැංකුව**

| නිලධාරියාගේ තනතුර | නිලධාරී සංඛ්‍යාව | හිමි දීමනාව |
|---|---|---|
| දිවිනැගුම ප්‍රජාමූල බැංකු කළමණාකරු | 01 | 5,000 |
| දිවිනැගුම ප්‍රජාමූල බැංකු සහකාර කළමණාකරු | 01 | 4,500 |
| අනෙකුත් බැංකු කාර්යය මණ්ඩලය (එක් අයෙකුට 4,000/- බැගින්) | 04 | 16,000 |

**දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති**

| නිලධාරියාගේ තනතුර | නිලධාරී සංඛ්‍යාව | හිමි දීමනාව |
|---|---|---|
| බැංකු සමිති කළමණාකරු | 01 | 3,000 |
| බැංකු සමිති සහකාර කළමණාකරු | 01 | 2,500 |
| අනෙකුත් කාර්යය මණ්ඩලය (ගිණුම් විෂය නිලධාරී - 02, ආයතන විෂය නිලධාරීන් - 01) | 03 | 6,000 |

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர்தலைமையதிபதி / Additional Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| Tel- | 011-2873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2887280 | 011-2873996 | **011- 2887722(Hotline)** |
| E-mail- | dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | **Desktop - Isuri- Chandratilaka sir** |

මෙම දීමනා ගෙවීම 2017 ජනවාරි මස සිට ආරම්භ කරනු ලබන අතර, ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන දිවිනැගුම ප්‍රජාමූල බැංකුව හා බැංකු සමිතිය මඟින් සලසා ගත යුතුය. දැනටමත් දිවිනැගුම ප්‍රජාමූල බැංකු කාර්යය මණ්ඩල සඳහා ගෙවනු ලබන රු.1,650/-ක කළමණාකරු දීමනාව හා 1,500/-ක බැංකු නිලධාරීන්ගේ දීමනාව 2016 දෙසැම්බර් 31 දිනට ගෙවීම් කිරීම අහෝසි වනු ඇත.

මෙම දීමනාව 2017 වර්ෂය තුල බැංකු නිලධාරීන් දිරි ගැන්වීමක් ලෙස සලකා ගෙවීම් කරනු ලබන අතර, 2018 වර්ෂය ජනවාරි මස සිට දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිතිවල බැංකු කාර්යය මණ්ඩලයේ වාර්ෂික කාර්යය සාධනය පදනම් කර ගනිමින් සිදු කරනු ඇත.

එහිදී දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිතිවල මූල්‍ය කළමනාකරණය සම්බන්ධව කාර්යය මණ්ඩලය වැඩි අවධානයක් යොමු කර ජනතා හිතවාදී, ප්‍රශස්ථ බැංකු ජාලයක් ගොඩ නගා ගැනීම සඳහා කටයුතු කරන මෙන් දන්වා සිටිමි.

නීල් බණ්ඩාර හපුහින්න,
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :- 01. ලේකම්, සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කා.දැ.ස.
02. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් - කා.දැ.ස.
03. මූලස්ථාන කළමණාකරුවන් - කා.දැ.ස
04. ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරුවන් - අ.ක.ස
05. දිවිනැගුම ප්‍රජාමූල බැංකු කළමණාකරුවන් - කා.දැ.ස.